# මොනරාගල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

මොනරාගල ප්‍රාදේශීය සභාවට 2025 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම පිණිස 2024.12.30 දින ප.ව.2.00 තෙක් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. භාණ්ඩ සැපයුම්

01. ලිපි ද්‍රව්‍ය (පෑන්, පැන්සල්, පොත්, කඩදාසි, ටෝනර්, රිබන්, රෝණියෝ තීන්ත ආදිය)
02. කාර්යාලීය උපකරණ (ෆැක්ස්, රෝණියෝ, ෆොටෝ කොපි යන්ත්‍ර ආදිය)
03. කාර්යාලීය ගෘහභාණ්ඩ (වානේ දැව)
04. විදුලි උපකරණ, වීථි පහන් , ඉලෙක්ට්‍රෝනික් උපකරණ හා ආරක්ෂිත කැමරා පද්ධති උපාංග ( CC TV, GPS Tracker , Camera)
05. ජලනල, ජලනල උපාංග හා සනීපාරක්ෂක උපාංග
06. පරිගණක යන්ත්‍ර උපාංග හා අමතර කොටස්
07. මෝටර් වාහන සහ යන්ත්‍රෝපකරණ අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි, බැටරි වතුර හා අනෙකුත් අමතර කොටස්)
08. නිල ඇඳුම්, රෙදි, සපත්තු, මේස්, බූට්, වැහි කබා, තිර රෙදි, මේස රෙදි ආදිය
09. සෞඛ්‍ය/සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ (කොසු, ඉදල්, බුරුසු, විෂබීජ නාශක, සබන්, අත්මේස් ආදිය)
10. වාහන, සත්ව බලපත්‍ර හා වරිපනම් තහඩු
11. මාර්ග නඩත්තු සහ වැඩබිම් උපකරණ (උදළු, සවල්, රේක්ක, කැති, මිනුම්පටි)
12. ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්, වැලි, සිමෙන්ති, සෙවිලි තහඩු, උළු, දැව, පස් ආදිය)
13. සියලුම වර්ගවල කොන්ක්‍රීට් නිෂ්පාදන (හියුම් පයිප්ප, කණු බ්ලොක් ගල්, බිම් ඇතුරුම් ආදිය)
14. පොහොර, වල් නාශක, කෘමිනාශක
15. ග්‍රීස් හා ඔයිල් වර්ග, කෙමිකල් වර්ග (රසායනික ද්‍රව්‍ය)
16. මුළුතැන්ගෙයි සංග්‍රහ උපකරණ ( හීටර් ජෝග්, පීරිසි කෝප්ප, වීදුරු ජෝග්, පිඟන්, බේසම්)
17. ගිනි නිවන උපකරණ නැවත පිරවීම (refill) ,ගිනි නිවන ඒකකයේ ආරක්ෂිත ඇඳුම් කට්ටල
18. LP ගෑස් සැපයීම

### 02. සේවා සැපයුම්

01. යන්ත්‍ර හා මෝටර් වාහන අළුත්වැඩියාව
02. වාහන සේවා කිරීම
03. කාර්යාලීය උපකරණ අළුත්වැඩියාව
04. කාර්යාලීය ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව
05. පරිගණක යන්ත්‍ර සහ උපාංග අළුත්වැඩියාව
06. මුද්‍රණසේවා සැපයීම
07. බැනර්, නාම පුවරු සැකසීම හා පෝස්ටර්, පත්‍රිකා මුද්‍රණය කිරීම
08. නිල මුද්‍රා, දින මුද්‍රා සකස් කිරීම.
09. ආහාරපාන සැපයීම
10. නීතිඥ හා උපදේශක සේවා සැපයීම
11. සිංහල/ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිපර්තනය කිරීම
12. ප්‍රවාහන සේවා සැපයීම (බස්, වෑන්,ත්‍රීරෝද රථ)
13. වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට සැපයීම (ලොරි, ටිපර්, මෝටර් ග්‍රේඩර්, ස්කැවේටර්, මාර්ග තලන ආදිය)
14. වායු සමීකරණ අළුත්වැඩියාව (වාහන / කාර්යාලීය)
15. ඇඳුම් සැපයීම (නිල ඇඳුම්,තිර රෙදි,මේස රෙදි, ආදිය)
16. රැස්වීම් හා උත්සව කටයුතු සඳහා ශාලා පහසුකම් සැපයීම.
17. රැස්වීම් හා උත්සව කටයුතු සඳහා උපකරණ සැපයීම.
18. කම්මල්කරුවන් ගේ සේවා
19. වාහන හෝස් සහ කේබල් අළුත්වැඩියා
20. ලියවන පට්ටල් සේවා
21. පෑස්සුම් හා යකඩ වැඩ සේවා
22. අභ්‍යන්තර දුරකථන පද්ධති, පරිගණක ජාල අළුත්වැඩියාව හා නඩත්තුව
23. ඩුප්ලෝ, රෝණියෝ හා ලැමිනේටින් සේවා
24. ගලි බවුසරයේ සේවා
25. අනතුරුදායක ගස් ඉවත් කිරීම

### කොන්ත්‍රාත්කරුවන්

කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම කාර්යාලයෙන් ලබාගන්නා ලද අයදුම් පත්‍රයක් සම්පූර්ණ කර පහත දැක්වෙන ලියාපදිංචි වීමේ ගාස්තුව සහ සුදුසුකම් හා වත්කම් සමග ඉදිරිපත් කල යුතුය. (අයදුම්පත්‍රය සඳහා රු.100/-)

**පොදු කොන්දේසි**

- එක් භාණ්ඩ හෝ සේවා සැපයුමක් වෙනුවෙන් එක් අයදුම්පතක් ලෙස වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.
- සියලු සැපයුම් හා සේවාවන්හි මිල ගණන් අවම මාස තුනක කාලයක් වලංගු විය යුතුය.
- සියලුම සැපයුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, සුදුසුකම් හා පළපුරුද්ද පිළබඳ සහතික ලියාපදිංචි වන අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය.

- ලියාපදිංචි වීම සඳහා මෙයට යා කොට ඇති ඉල්ලුම්පත්‍රය භාවිතා කල යුතුය. සැපයුම් විෂයක් සඳහා රු.1000.00 ක මුදලක් ගෙවා ලියාපදිංචි විය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම්, මොනරාගල ප්‍රාදේශීය සභාව නමින් ලිවිය යුතුය. අයදුම්පත් භාර ගැනීම 2024.12.30 දින ප.ව. 2.00 ට අවසන් වේ. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙලවරේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම 2025 වර්ෂය යනුවෙන් සඳහන් කල යුතුය.

  - සැපයුම්කරුවන්ගේ ව්‍යාපාරය සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචියක් හෝ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්යය වේ. ලියාපදිංචි සහතිකය අයදුම්පත්‍රයට ඇමිණිය යුතුය.
  - භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධව පළපුරුද්ද පිලිබඳ සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය.
  - ලියාපදිංචි ලබාදීම සම්බන්ධයෙන් අවසාන තීරණය මොනරාගල ප්‍රාදේශීය සභාව සතුවේ.
  - වැට්බදු සහතික හිමි අය වැට්බදු සහතිකය ඇමිණිය යුතුය.
  - අවශ්‍යතාවය මත ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිභාහිරව භාණ්ඩ හා සේවා ලබාගැනීමේ අයිතිය සභාව සතුය.
- අවශ්‍යතාවය නිසි පරිදි දැන්වූ පසු මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඇණවුම් කිරීමෙන් පසු නියම කරන ලද කාලය තුලදී සැපයීමට අපොහොසත් වන හෝ සිය සැපයුම් අදාල පිරිවිතර හා නියැදිවලට අනුකූල නොවන සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කරනු ලැබේ.

- ද්‍රව්‍ය සඳහා මිලදී ගැනීමේ අවස්ථාවේදීම ගෙවීම් බලාපොරොත්තුවන්නන් ලියාපදිංචි කරනු නොලැබේ. අවම වශයෙන් දින 30 ක ණය කාල සීමාවක් ප්‍රාදේශීය සභාව වෙත ලබා දිය යුතුය.

- ලියාපදිංචි කරගත් සියලුම සැපයුම්කරුවන්ට ඒ පිළිබඳව දන්වා යවනු ලැබේ.
- වැඩි විස්තර කාර්යාල වේලාව තුළ මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය. දුරකථන අංකය 055-2276175 Email – mon.prasabawa@gmail.com

- අයදුම්පත්‍ර මෙම කාර්යාලයෙන් හෝ අපගේ වෙබ් අඩවියට පිවිස ලබාගන්න . www.monaragala.ps.gov.lk

ඒ.සෝමලතා පෙරේරා,
ලේකම්, මොනරාගල ප්‍රාදේශීය සභාව